# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1637/26 – 2010 ජනවාරි 22 වැනි සිකුරාදා – 2010.01.22

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජීවන් කුමාරණතුංග වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාතවැලිවිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක GA/WDT/07/426 සහ 2007.12.18 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර “ඒ” වශයෙන් වූ මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්. 3.409ක් වූ මුදුබෙන්කන්ද *හෙවත්* ඇලඋඩවිලකන්ද නමැති ඉඩම් කොටසට මායිම් :

01. කැබලි අක්ෂර “ඒ” – මුදුබෙන්කන්ද *හෙවත්* ඇලඋඩවිලකන්ද – ප්‍රමාණය: හෙක්. **3.409**

උතුරට: කැබලි අංක 64, 62 සහ 60; නැගෙනහිරට: කැබලි අංක 62, 60 සහ 123; දකුණට: කැබලි අංක 60 සහ 123 මාර්ගය සහ කැබලි අංක 100: බටහිරට: මාර්ගය, කැබලි අංක 100, 98 සහ 64.

ජීවන් කුමාරණතුංග,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය,

මගේ යොමු අංකය- එල්ඩී/05/2006/පීඅයිඑස්ඩී/371.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය- වැදි/3/ගම්පු/පාත.
2009 ඔක්තෝබර් 20 වැනි දින,
‘ගොවිජන මන්දිරය’, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 – 157

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, ඉඩම් සංවර්ධන ජනාවාස හා රණවිරු සුහ සාධන අමාත්‍ය ජොන්ස්ටන් ක්ෂේවියර් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වලස්මුල්ල ගමේ කැටකාලගහහේන ඉඩමේ අක්කර 01, රූඩ් 00, පර්චස් 25ක ප්‍රමාණයෙන් යුක්ත ඉඩම :

කැබලි අක්ෂර “ඒ”– කැටකාලගහහේන – ප්‍රමාණය: හෙක්. **0.4707**ක් පමණ

උතුරට: මහා මාර්ගය හා වික්‍රමසිංහ හෙට්ටිආරච්චිගේ ආරියදාස හිමිකම් කියන කැටකාලගහහේන; නැගෙනහිරට: මුස්ලිම් පල්ලිය හිමිකම් කියන ගාලබැදිහේන; දකුණට: ප්‍රවේශ මාර්ගය; බටහිරට: මුරුතවෙල ධම්මසිරි හිමිකම් කියන කැටකාලගහහේන.

ජොන්ස්ටන් ක්ෂේවියර් ප්‍රනාන්දු,
ඉඩම්, ඉඩම් සංවර්ධන ජනාවාස හා
රණවිරු සුහ සාධන අමාත්‍ය,

2010 ජනවාරි මස 15 වැනි දින,
‘ගොවිජන මන්දිරය’, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 158

1A – G12358 – 355 (2010 / 01)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී